# රෝමයේ ලතරානු බැසිලිකා දෙව් මැදුර කැපකිරීමේ මංගල්‍යය

## පළමුවන දේව ප්‍රකාශනය — එසෙකියෙල් 47:1–2, 8–9, 12

*එසෙකියෙල් දිවැසිවරයාගේ පොතෙන් උපුටා ගත් කොටසකි.*

“ශුද්ධස්ථානයෙන් ජීවන ජලය ගලා එන්නේ ය.”

ඒ මනුෂ්‍යයා දේව මාළිගාවේ දොරකඩ ළඟට මා නැවත පැමිණෙව්වේ ය. එවිට දේව මාළිගාවේ එළිපත්තට යටින් නැගෙනහිර දෙසට වතුර ගලා යන බව මම දිටිමි. මන්ද, දේව මාළිගාවේ ඉස්සරහ පැත්ත නැගෙනහිර දෙසට තිබුණේ ය. ඒ වතුර දේව මාළිගාවට දකුණු පැත්තෙන් පූජාසනයට දකුණෙන් එළිපත්තට යටින් ගලා ආවේ ය. එකල ඔහු මා ද්වාර මණ්ඩපයෙන් පිටතට ගෙනගොස්, නැගෙනහිර ට මුහුණ පා තිබුණු පිටත දොරටුව ළඟට වටකරින් මා පැමිණෙව්වේ ය. එවිට වතුර දකුණු පැත්තෙන් වැගිරෙනු දිටිමි.

ඔහු කතා කරමින්, “මේ වතුර නැගෙනහිර දිශාවට ගලා ගොස්, අරබා සමභූමියට බැස ගොස් එහි මළ මුහුදට ඇතුළු වූ විට ජලය මිරිදියට හැරුණේ ය. මේ ගංගාව ගලා යන සෑම තැන ම රාශි ගණන් පණ ඇති සියලු ම සත්ත්වයෝ ජීවත් වන්නෝ ය. එසේ මත්ස්‍යයන් මහා ගණනක් හටගනු ඇත. මන්ද, මේ වතුර එහි පැමිණි විට අනික් ඒවා මිරිදිය වන්නේ ය. ගංගාව ගලා යන කොතැනක වුව ද සිටින සියල්ලන් ජීවත් ව සිටිනු ඇත. ගඟ ඉවුරේ දෙපැත්තේ ම සියලු ආකාර පලතුරු වැවෙන්නේ ය. ඒවායේ කොළ වේළෙන්නේ වත්, ඒවායේ පල වරන්නේ වත් නැති ව හැම මාසයේ ම අලුත් පල දරන්නේය. මන්ද, ඒවායේ වතුර ශුද්ධස්ථානයෙන් ම නික්ම එන්නේ ය ඒවායේ පල ආහාර පිණිසත්, ඒවායේ කොළ ඖෂධ පිණිසත් වන්නේ ය” යයි කී ය.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය

ගීතාවලිය 46:1–3, 5–6, 8–9

පිළිතුර: ගංගාවේ දිය දහරා දෙවිඳුන්ගේ නුවරට සෙත සලසන්නේය.

ගීය : දෙවිඳාණෝ අපේ ශක්තිය හා සරණ වන සේක:
හැම දා විපතේ දී අප හට පිළිසරණක් වන සේක.

මහ පොළොව කම්පා වෙතත්,
කඳු වැටි මහ මුහුදට කඩා වැටෙතත්,
සත් සමුදුර ගුගුරා කැළඹෙතත්,
එයින් නැගෙන රළ වේගයෙන් කඳු වැටි සැලෙතත්
අපට කිසි විටක බියක් නැත.

දෙව් තුමාණෝ ඒ නුවර වැඩ වසන සේක.
ඊට කිසි දා විපතක් නොවනු ඇත.
දෙව් තුමාණෝ අලුයම් වේලෙහි ඊට පිහිට වන සේක.

ජාතීහු කෝලහල කළහ: රාජධානි බිඳ වැටිණි.
දෙව් තුමාණෝ ගිගුරුම් දුන් සේක.
මහ පොළොව දිය විණි.

එන්න, සමිඳුන්ගේ වික්‍රම ක්‍රියා බලන්න:
මිහි මත කර ඇති පුදුම ක්‍රියා නරඹන්න.

එතුමාණෝ මිහි මත දස දෙස යුද බිය නවත්වන සේක:
දුන්න බිඳ, හෙල්ලය කපා, පලිහ ගින්නෙන් දවන සේක.

## දෙවන දේව ප්‍රකාශනය 1 කොරින්ති 3: 9-13, 16-17

*ශුද්ධ වූ පාවුලු තුමන් විසින් කොරින්තිවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් උපුටා ගත් කොටසකි.*

"ඔබ දෙවියන් වහන්සේගේ මන්දිර ය ය."

මන්ද, අපි දෙවියන් වහන්සේ සමග සහකාර සේවකයෝ වෙමු. ඔබ දෙවියන් වහන්සේගේ කෙත ය, දෙවියන් වහන්සේගේ ගොඩනැගිල්ල ය.

මට දෙන ලද දේව වරප්‍රසාදය පරිදි මම දක්ෂ ගෘහ නිර්මාණ ශිල්පියෙකු මෙන් අත්තිවාරමක් දැමීමි. වෙන කෙනෙක් ඒ මත ගොඩනගයි. එහෙත් එකිනෙකා එය මත ගොඩනගන ආකාරය ගැන විමසිලිමත් විය යුතු ය. මන්ද, දැනට ම දමා ඇති අත්තිවාරම හැර වෙන අත්තිවාරමක් දැමීමට කිසිවෙකුට නුපුළුවන. ඒ අත්තිවාරම නම් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ය. මේ අත්තිවාරම මත ගොඩනැගීමට යම් යම් අය යොදන්නේ රන්, රිදී, අගනා මැණික්, දැව, තෘණ හෝ පිදුරු නම්, ඔවුන්ගේ කර්මාන්තයේ තත්ත්වය, හෙළිදරව් වන්නේ ය. ඒ දවස ගින්න සහිත ව උදා වේ. ඒ ගින්නෙන් ඒ ඒ කර්මාන්ත පරීක්ෂා කරනු ලැබීමෙන් ඒවායේ නියම ස්වභාවය හෙළි වේ.

ඔබ දෙවියන් වහන්සේගේ මන්දිරය බවත්, ඔබ තුළ දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වැඩ වසන බවත් නොදන්නාහු ද? කිසිවෙකු දේව මන්දිරය වැනසුවොත් දෙවියන් වහන්සේ ඒ තැනැත්තා වනසන සේක. දෙවියන් වහන්සේගේ මන්දිරය විශුද්ධ ය. ඒ මන්දිරය නම් ඔබ ය.

*දේව වචනය මෙසේ ය.*

## සුපුවත් ජය නද 2 වංශාවලිය 7:16

ආලේලූයා! ආලේලූයා!
“දැන් ද ඉදිරියට ද මාගේ නාමය
මේ මාලිගාවෙහි සදහට ම තිබෙන පිණිස
මෙය තෝරාගෙන විශුද්ධ කෙළෙමි.
මාගේ නෙත් ද මාගේ සිත ද
නිතර ම මෙතැනට යොමු වී තිබෙන්නේ ය”යි
සමිඳාණන් වහන්සේ වදාරන සේක.
ආලේලූයා!

## සුවිශේෂය ජොහන් 2: 13–22

*සුවිශේෂක ජොහන් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

### උන් වහන්සේ කතා කළේ තමන් වහන්සේගේ ශරීරය නමැති ශුද්ධවූ මන්දිරය ගැනය.

ජුදෙව්වරුන්ගේ පාස්කු මංගල්‍යය ආසන්න ව තිබුණු බැවින්, ජේසුස් වහන්සේ ජෙරුසලමට වැඩම කළ සේක. එවිට, දේව මාළාගාවේ ගව, බැටළු හා පරෙවි වෙළෙන්ඳන් ද මුදල් මාරු කරන්නන් ද ගනුදෙනුවෙහි යෙදී හිඳිනු උන් වහන්සේ දැක, ලණුවලින් කසයක් සාදාගෙන ගවයන් හා බැටළුවන් හා සියල්ලන් දේව මාලිගාවෙන් පිටතට පළවා හැර, මුදල් මාරු කරන්නන්ගේ කාසි විසුරුවා ඔවුන්ගේ මේස පෙරළා දැමූ සේක. ඉන්පසු උන් වහන්සේ පරෙවි වෙළඳුන් අමතා, “මේවා අහකට ගෙන යන්න; මාගේ පියාණන්ගේ ගෘහය වෙළඳ පොළක් නො කරන්නැ”යි වදාළ සේක. “ඔබගේ ගෘහයට ඇති උද්යෝගයෙන් මම දැවෙමි” යි ලියා තිබෙන බව එවිට ශ්‍රාවකයන්ට මතක් විය.

එකල ජුදෙව්වරු, “ඔබ මේ දේවල් කරන බැවින් ලකුණක් පිණිස කුමන හාස්කමක් අපට දක්වන්නෙහි දැ”යි ඇසූ හ. ජේසුස් වහන්සේ ඔවුන්ට පිළිතුරු දෙමින්, “මේ දේව මාලිගාව කඩාදමන්න තෙදිනකින් එය මම ගොඩනඟන්නෙමි”යි වදාළ සේක. එවිට ජුදෙව්වරු කතා කොට, “මේ දේව මාළිගාව ගොඩනඟන්නට හතළිස් හය වසක් ගත විය. ඔබ එය තෙදිනකින් ගොඩනඟන්නෙහි දැ”යි ඇසූ හ. එහෙත්, උන් වහන්සේ කතා කෙළේ, තමන්ගේ ශරීරය නමැති දේව මාලිගාව ගැන ය. උන් වහන්සේ මරණින් නැඟිටුවනු ලැබූ පසු, ශ්‍රාවකයෝ, උන් වහන්සේ මේ කී දේ බව සිහි කොට ශුද්ධ ලියවිල්ල ද උන් වහන්සේගේ වචනය ද විශ්වාස කළහ.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*